# ජාතික අධ්‍යාපන ආයතනය

# උපාධි ප්‍රදානෝත්සවය 2022

# උපදෙස් පත්‍රිකාව

**01. උපාධි ප්‍රදානෝත්සව තොරතුරු**

- දිනය/දින : 2022.12.27 හා 2022.12.28
- ස්ථානය : බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ - 07
- වේලාව : පෙ.ව. 09.00 - 12.00 (පෙරවරු සැසිය)
  ප.ව. 01.00 - 04.00 (පස්වරු සැසිය)

**02. ඇඳුම් පිළිබඳ තොරතුරු**

- උපාධිලාභීන් : ජාතික ඇඳුම හෝ යුරෝපීය ඇඳුමෙන් (කලිසම, අත් දිග කමිසය, උඩ කබාය, ටයි පටිය, සපත්තු) සැරසී සිටිය යුතු ය.
- උපාධිලාභිනියන් : සාරියකින් හෝ ඔසරියකින් සැරසී සිටිය යුතු ය.

**03. සහභාගිවන්නන් සඳහා උපදෙස්**

- උපාධි ප්‍රදානෝත්සව දින ඔබ වෙනුවෙන් ඔබගේ පවුලේ එක් අයෙකුට පමණක් ආරාධිතයෙකු ලෙස ශාලාවට ඇතුලුවීමට අවසර ලබා දෙන අතර ඔහු/ඇය ද උත්සවයට යෝග්‍ය ඇඳුමින් සැරසී සිටිය යුතු ය.
- කවර හේතුවක් නිසා හෝ ඔබ සමඟ පැමිණෙන අයගෙන් එක් අයෙකුට වඩා ශාලාවට ඇතුලු වීමට ඉඩ නො ලැබෙන බව අවධාරණය කෙරේ.
- ඔබ වෙනුවෙන් නිකුත් කරන ආරාධනා පත්‍රයේ අංකය ම ඔබ සමඟ ශාලාවට ඇතුලු වන අමුත්තා සඳහා ද නිකුත් කරන බැවින් අන්සතු ආරාධනා පත්‍ර භාවිත කර ඔබ සමග පැමිණෙන අමතර අයට ශාලාවට ඇතුලු වීමට ඉඩ දෙනු නොලැබේ. (අවු 12ට පහළ ළමුන් අමුත්තන් ලෙස ඇතුල් කරනු නොලැබේ.)
- උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වෙන ශාලාව තුළට ජංගම දුරකථන, බීම බෝතල, කුඩ, අත්බෑග් රැගෙන ඒමෙන් වැළකී සිටිය යුතු ය.
- ඔබ හෝ ඔබ සමග පැමිණෙන අමුත්තාට ශාලාව තුළ ඡායාරූප ගැනීමට අවසර නොලැබේ.

**04. පෙරහැරට සහභාගී වීම**

- උපාධි ප්‍රදානෝත්සවය සඳහා ඔබ ශාලාවට ඇතුලු කරනු ලබන්නේ උපාධි පෙරහැරකිනි.
- ශාලාවට ඇතුලු කිරීමට විනාඩි 45 කට පෙර පෙරහැරේ ඔබට අදාළ ස්ථානයේ උපාධි කබායෙන් සැරසී ස්ථානගත වී සිටිය යුතු ය.
- පෙරහැරට සහභාගී වීම ඔබට ලබා දී ඇති අංකය අනුව සිදු විය යුතු ය.
- උපාධි කබායකින් හා අදාළ ඇඳුමින් සැරසී නොසිටිය හොත් පෙරහැරේ ගමන් කිරීමට ඔබට අවස්ථාව නො ලැබේ.
- උපාධි උත්සව සංවිධායකයන් විසින් ලබා දෙන උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.
- ඔබ උපාධි පෙරහැරේ ගමන් කිරීමේ දී එහි ගෞරවය ආරක්ෂා වන පරිදි හැසිරිය යුතු ය.

**05. උපාධි කබාය හා පදක්කම නිකුත් කිරීම**

- උපාධි කබාය හා පදක්කම නිකුත් කිරීම පහත ආකාරයට සිදුවේ.

| දිනය | වේලාව | ස්ථානය |
|---|---|---|
| 2022.12.26 | පෙ.ව. 6.00 සිට රාත්‍රී 11.00 | ජාතික අධ්‍යාපන ආයතනයේ අංක 05 ගොඩනැගිල්ලේ දෙවන මහලේ කාමර අංක T314, T315, T316, T317, |
| 2022.12.27 | පෙ.ව. 6.00 සිට රාත්‍රී 11.00 | |
| 2022.12.28 | පෙ.ව. 6.00 සිට දහවල් 12.00 | |

- ඔබ විසින් ම උපාධි කබාය භාරගත යුතු වේ. කවර හේතුවක් නිසා හෝ වෙනත් අයෙකුට උපාධි කබාය නිකුත් කරනු නො ලැබේ.
- උපාධි කබාය හා පදක්කම භාර ගැනීමට පැමිණෙන විට ඔබගේ ජාතික හැඳුනුම්පත හෝ පාඨමාලා හැඳුනුම්පත/ශිෂ්‍ය වාර්තා පොත රැගෙන ආ යුතු වේ.
- උපාධි කබාය හා පදක්කම නිකුත් කරන අවස්ථාවේ දීම ආරාධනා පත්‍ර, තේ පැන් සංග්‍රහ කාඩ්පත් ලබා දෙනු ඇත.
- උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වෙන ස්ථානයේ දී කිසිදු හේතුවක් නිසා උපාධි කබා හා පදක්කම් නිකුත් නො කරන බව සහ බාර නොගන්නා බව කාරුණික ව සලකන්න.

**06. උපාධි කබාය හා පදක්කම ආපසු භාර ගැනීම හා සහතික පත් නිකුත් කිරීම**

- උපාධි කබාය හා පදක්කම ඔබ විසින්ම ආපසු භාර දිය යුතු වේ.
- උපාධි කබාය හා පදක්කම ආපසු භාර ගැනීම පහත ආකාරයට සිදුවේ.

| දිනය | වේලාව | ස්ථානය |
|---|---|---|
| 2022.12.27 | ප.ව. 1.00 සිට රාත්‍රී 11.00 | ජාතික අධ්‍යාපන ආයතනයේ අංක 05 ගොඩනැගිල්ලේ දෙවන මහලේ කාමර අංක T314, T315, T316, T317, |
| 2022.12.28 | පෙ.ව. 6.00 සිට රාත්‍රී 11.00 | |
| 2022.12.29 | පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 | |
| 2022.12.30 | පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 | |

- උපාධි කබාය හා පදක්කම භාර දීමෙන් පසු ලැබෙන රිසිට් පත ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් ඔබට හිමි උපාධි සහතිකය ලබා ගත හැකි ය. රිසිට් පත නොමැති ව සහතික පත්‍ර නිකුත් කරනු නොලැබේ.
- 2022.12.30 දිනට පසු භාර දෙන සෑම උපාධි කබායක් හා පදක්කමක් සඳහා ම එක් දිනකට රු. 500/= බැගින් ප්‍රමාද ගාස්තුවක් අය කිරීමට සිදුවන බව සළකන්න.
- යම් හෙයකින් උපාධි කබාය හා පදක්කම අස්ථානගත වුවහොත් ජාතික අධ්‍යාපන ආයතනය විසින් නියම කරනු ලබන මුදලක් ඒ සඳහා ගෙවීමට ඔබට සිදු වේ.

**07. ඡායාරූප ලබා ගැනීම**

- ඡායාරූප ලබා ගැනීම සම්බන්ධ කටයුතු ඔබගේ පෞද්ගලික කාර්යයක් වේ.
- ඡායාරූප ලබා ගැනීම සඳහා පෞද්ගලික ආයතනයක සහාය ලබා දීමට ජාතික අධ්‍යාපන ආයතනය කටයුතු යොදා ඇත.
- ඔබට අවශ්‍ය ඡායාරූප සඳහා අදාළ ගෙවීම් එම පෞද්ගලික ආයතනයට පමණක් කළ යුතුය.
- උපාධි ප්‍රදානෝත්සවයේ ඔබට අවශ්‍ය ඡායාරූප සඳහා අදාළ ගෙවීම් කර ඇණවුම් භාර දීම සිදු කිරීමට 2022.12.26 හා 27 දින පෙ.ව. 8.00 සිට ප.ව. 6.00 දක්වා ජාතික අධ්‍යාපන ආයතනයේ අංක 04 ගොඩනැගිල්ලේ බිම් මහලේ දී සිදු කිරීමට පහසුකම් සපයා ඇත.
- ඔබ විසින් මුදල් ගෙවා ඇණවුම් කරන ලද එම ඡායාරූප ගැනීම උපාධි ප්‍රදානෝත්සවය දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පිළියෙල කරන ලද ස්ථාන කිහිපයක දී සිදු කරනු ලැබේ.
- ඡායාරූප සම්බන්ධ ව විමසීම් අදාළ ඡායාරූප ආයතනය සමඟ සිදු කළ යුතු අතර මේ සම්බන්ධ ව කිසිදු විමසීමක්, බැඳීමක් හෝ වගකීමක් ජාතික අධ්‍යාපන ආයතනයට නොමැති බව සළකන්න.

**08.සංග්‍රහ කටයුතු**

- උපාධි ප්‍රදානෝත්සවයෙන් පසු ඔබ හා ඔබ සමග සහභාගී වන එක් අයෙකුට පමණක් අදාළ ආරාධනා පත්‍රය ඉදිරිපත් කිරීමෙන් සංග්‍රහය භුක්ති විදිය හැකි ය.
- මේ සඳහා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ වෙන් කර ඇති නියමිත ස්ථානයේ දී පමණක් එම සංග්‍රහ කටයුතු කරනු ලැබේ. (ශාලාවෙන් පිට ආලින්දයේ)
- මෙම සංග්‍රය වෙනුවෙන් ගාස්තු හෝ මුදල් අය නො කෙරේ.

**09.පොදු උපදෙස්**

- කිසිදු හේතුවක් නිසා ශාලාවේ පිට ඇති පඩි පේළිවල රංචු වශයෙන් වාඩිවී සිටීම, නිදා ගැනීම හෝ කෑම ගැනීම නොකළ යුතු අතර මේ සම්බන්ධයෙන් අපගේ ආරක්ෂක නිලධාරීන් ලබා දෙන උපදෙස් පිළිපැදීමට ඔබ සමඟ පැමිණෙන අය දැනුවත් කරන්න.
- ඔබ පුද්ගලික වාහනයක පැමිණෙන්නේ නම් සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ නියමිත ස්ථානයේ නවතා තබා ගැනීම ඔබගේ වගකීම වේ.
- ජාතික අධ්‍යාපන ආයතනයේ සහ ඔබගේ ගෞරවය ආරක්ෂා වන ආකාරයට විනයගරුකව හැසිරිය යුතු අතර ලබා දී ඇති උපදෙස් මැනවින් පිළිපැදීමෙන් උත්සවයේ අභිමානවත් බව රැක ගැනීමට සහයෝගය අපේක්ෂා කරමි.
- නොවැළැක්විය හැකි හේතුවක් නිසා උපාධි ප්‍රදානෝත්සව දිනය වෙනස් වන්නේ නම් ඒ බව මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මගින් ප්‍රචාරය කරන අතර ලිඛිතව ද ඔබ වෙත දැනුම් දෙනු ලැබේ. ඒ පිළිබඳව අවධානයෙන් සිටින ලෙස මෙයින් කාරුණිකව දැනුම් දෙනු ලැබේ.
- **මෙම උපාධි ප්‍රදානෝත්සවය Channel NIE YouTube මගින් සජීවීව විකාශනය කිරීමට කටයුතු යොදා ඇති බැවින් ඔබගේ පවුලේ සාමාජිකයින්ට නිවසේ සිට සජීවීව නැරඹිය හැකිය.**